Sponsored by Kandy Food & Spices, Hampton Park

**.........එයින් ප්‍රධානම තැනක් ගන්නේ අපේ ක්‍රිකට් පිටි වල තණතිලි සැකසීම හා නඩත්තුව ඉතා පහත තත්වයක තිබීමයි. ශ්‍රී ලංකාව ටෙස්ට් තරගාවලියෙන් ජය ලැබුවද ගාල්ලේ ජාත්‍යන්තර ක්‍රිකට් පිටියේදී ලැබූ ඉණිමක් ඇතුළු අන්ත පරාජයට වගකිවයුත්තේ ශ්‍රී ලංකා කණ්ඩායම නොව ක්‍රීඩා කළ තණතිල්ල බව ඉතා පැහැදිළිව පෙනෙන්නට තිබුණි.**

## ඉන්දියා ශ්‍රී ලංකා ක්‍රිකට් තරගාවලිය

# කාසියේ වාසිය ජයගත් තරගාවලිය







ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පැවැත්වූ ක්‍රිකට් තරග මාලාව නිමාවට පත්විය. ක්‍රිකට් බලාධාරීන් අනිවාර්යයෙන්ම සලකා බැලිය යුතු ඉතා වැදගත් කරුණු කීපයක් එම තරගාවලිය තුළින් මතුවූ බව සඳහන් කරනු කැමැත්තෙමි. එයින් ප්‍රධානම තැනක් ගන්නේ අපේ ක්‍රිකට් පිටි වල තණතිලි සැකසීම හා නඩත්තුව ඉතා පහත තත්වයක තිබීමයි. ශ්‍රී ලංකාව ටෙස්ට් තරගාවලියෙන් ජය ලැබුවද ගාල්ලේ ජාත්‍යන්තර ක්‍රිකට් පිටියේදී ලැබූ ඉණිමක් ඇතුළු අන්ත පරාජයට වගකිවයුත්තේ ශ්‍රී ලංකා කණ්ඩායම නොව ක්‍රීඩා කළ තණතිල්ල බව ඉතා පැහැදිළිව පෙනෙන්නට තිබුණි. ඒ පිලිබඳව නම සඳහන් කරනවාට අකැමැති ශ්‍රී ලංකා ක්‍රිඩකයකු සන්නසට පැවසුවේ ගාල්ල ක්‍රීඩාංගනය ලෝකයේ ස්වභාව සෞන්දර්යයෙන් සපිරි හොඳම ක්‍රීඩාංගනයක් බව ලෝකයේ ඕනෑම ක්‍රිකට් කණ්ඩායමක් පිළිගනු ලැබුවත් තරගයක දෙවැනි දිනෙන් පසු තව දුරටත් ක්‍රීඩා කරන්නට තරම් සුදුසු තණතිල්ලක් එහි නොමැති බවයි. ඒ අනුව බැලූ කළ කාසියේ වාසිය මත තරගයේ ජය හෝ පරාජය තීරණය වීම නොවැළැක්විය හැකි ය.

දඹුල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේ තත්වය ද කණගාටුදායකය. කණ්ඩායම් දෙකෙන් එක් කණ්ඩායමකටවත් ලකුණු 150ක් රැස් කළ නොහැකි මට්ටමේ තණතිලි සහිත ක්‍රීඩාංගන වල තරග පැවැත්වීමේ තේරුමක් තිබේදැයි සිතා බැලිය යුතු ය. විදේශ කණ්ඩායම් සමග තරග සංවිදානය කිරීමට පෙර එම ක්‍රීඩාංගන තුළ හැකි තරම් දේශීය තරග පවත්වා තණතිලි වල තත්වය වැඩි දියුණු කරන්නට ක්‍රිකට් බලධාරීන් කටයුතු නොකරන්නේ මන්දැයි සිතාගත නොහැකිය.

ප්‍රේමදාස ක්‍රිඩාංගනයේ තත්වයද මෙයට දෙවැනි නැත . ඉතිහාසයේ සිටම මේ ක්‍රීඩාංගණයේ ද දිවා රාත්‍රී තරග වල ජයග්‍රහණය තීරණය වන්නේ කාසියේ වාසිය මතය. මෙවැනි තත්වයන් යටගේ පවත්වන ක්‍රිකට් තරග තුළින් ක්‍රීඩා ලෝලයනට දැක ගන්නට හැකිවන්නේ දක්ෂ කන්ඩායම් ලබන ජයග්‍රහණ නොව වාසනාව මත ලබා ගන්නා ජයග්‍රහණ බව සඳහන් කරණු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා කණ්ඩායමට නවක දක්ෂ ක්‍රිඩකයන් අත්‍යවශ්‍ය කාල වකවානුවක නවක ක්‍රීඩකයන් කීපදෙනෙකු ම තමනගේ දස්කම් ඔප මට්ටම් කරගනු දක්නට ලැබීම තරගාවලියේ දී දක්නට ලැබුණු සතුටට පත්විය හැකි කරුණකි. විශේෂයෙන් තුන් ඉරියව්වෙන්ම කැපී පෙනෙන ක්‍රීඩක තිලාන්

**ශ්‍රී ලංකා කණ්ඩායමට නවක දක්ෂ ක්‍රිඩකයන් අත්‍යවශ්‍ය කාල වකවානුවක නවක ක්‍රීඩකයන් කීපදෙනෙකු ම තමනගෙ ' දස්කම් ඔප මට්ටම් කරගනු දක්නට ලැබීම තරගාවලියේ දී දක්නට ලැබුණු සතුටට පත්විය හැකි කරුණකි.**

තුෂාර ආරම්භක පිතිකරු මලින්ද වර්ණපුර දැගපන්දු යවන අජන්ත මෙන්ඩිස් එක්දින ආරම්භක පිතිකරු මහේල උඩවත්ත වැනි ක්‍රිඩකයන්ට තවත් අවස්ථා ලබා දී ඔවුන් රැක ගැනීම ක්‍රිකට් බලාධාරීන්ගේ පරම වගකීමකි. ඔවුන් දැක්වූ දක්ෂකම් තිලකරත්න ඩිල්ෂාන් හා චාමර සිල්වා කණ්ඩායමෙන් ඉවත් කිරීමට තරම් පීඩනයක් ඇතිකළ බව දක්නට ලැබුණි. එක් දින තරගාවලිය 2 - 3 පරාජයක් ලැබුවද නායකයකු ලෙස හා පිතිකරුවකු ලෙස මහේල ප්‍රශංසනීය සේවයක් කළ බවත් කිව යුතුම ය. එක් දින තරගාවලිය තුළ කුමාර් සංගක්කාර පසුබෑමකට ලක්වුව ද සුපුරුදු පරිදි විදේශ තරගාවලියකින් ඔහු නැවත ලකුණු අතරට පැමිණෙනු ඇතැයි විශ්වාස කල හැකි ය. කලින් සඳහන් කළ පරිදි තණතිලි වල දුර්වල කම් ද සංගක්කාරගේ රිද්මය බිඳවැටීමට බලපාන්නට ඇතැයි සිතිය හැකි ය.

මෙම කරුණු සියල්ලටම වඩා සුවිශේෂි සිදුවීමක් මෙම තරගාවලිය තුළින් ක්‍රිඩා ලෝලීන්ට දැකගන්නට ලැබුණි. එනම් ශ්‍රී ලංකාව වෙනුවෙන් ආරම්භක පන්දු යවන චමින්ද වාස් එක් දින කඩුලු 400 පසු කිරීමයි. මෙම සුවිශ්සී දස්කම පෑමට හැකි වූ ලොව 4 වැනි ක්‍රීඩකයා ලෙස චමින්ද වාස් ඉතිහාසයට එක්වෙයි. මෙයට පෙර මෙම දස්කම පා ඇත්තේ ආසියානු කීඩකයන් වන වසීම් අක්‍රම් වකාර් යුනුස් හා මුරලිදරන් යන ක්‍රිඩකයන් තිදෙනා ය. මෙතරම් දිගු කාලයක් අත පය කොන්ද ආබාධ වලින් වැළකී ශ්‍රී ලංකාවට ඉතා සුවිශේෂි සේවාවක් කළ චමින්ද වාස්ට ශ්‍රී ලංකා ක්‍රීඩා ලෝලීන් ගේ සිත් තුළ ඇති ගෞරවාදරය පුංචි තිරයෙන් ලොව වටා දිස්වනු දක්නට ලැබුණි.

අසෝක සිල්වා